**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි (ගෞරව) පාඨමාලාව - 3 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2022/2023**

LLU3601- **ශ්‍රී ලංකාවේ නීති පද්ධති සහ නීති ඉතිහාසය**

**කාලය - පැය තුනයි. (03)**

---

**දිනය - 2024.02.22** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30**

---

සම්පූර්ණ ප්‍රශ්න ගණන 08 යි.

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

**01.** "රෝම ලන්දේසි නීතිය (ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට) හඳුන්වා දීම එනයින්ම මූලික වැදගත්කමක් විය. විවිධ චාරිත්‍රානුකූල නීති පද්ධති සංග්‍රහගත කිරීම අනාගත පරම්පරා උදෙසා වූ රටාව සකස් කළ අතර එමගින් ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ රෝම ලන්දේසි නීතියේ මූලික ප්‍රමුඛත්වය තහවුරුවිය. නමුත්, මෙම නෛතික මිශ්‍රණයට අවසන් අමුද්‍රව්‍ය එක් කිරීමට බ්‍රිතාන්‍යයන්ට ඉතිරිව තිබුණි."

George C. Cameron, '*Sri Lanka's Legal System: Museum of Antiquities or Melting-Pot of Ideas?* 1987

ඉහත ප්‍රකාශය අනුව, රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම, පිළිගැනීම සහ බ්‍රිතාන්‍ය පාලනය යටතේ රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ සංස්ථාපනය පිළිබඳව සාකච්ඡා කරන්න.

**(ලකුණු - 20)**

**02.** "ව්‍යවස්ථාපිත අණ පනත් තෝරා බේරා භාවිතා කිරීම මඟින් සහ නඩු පැවරීමේ ක්‍රියාවලියෙහි නොපෙනෙන පරිණාමය හරහා බ්‍රිතාන්‍යයෝ ශ්‍රී ලංකා නීතිය නැවත සකස්කර නැවත හැඩ ගස්වා එහි යල්පැනගිය අංග ඉවත් කර නව ගැටළු වලට මුහුණ දීම සඳහා එය අනුගත කළහ. "

U. Egalahewa, *Commercial Law of Sri Lanka: Applicability of Laws in England*, 2020

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ව්‍යවස්ථා සම්පාදනය හරහා ශ්‍රී ලංකාවට ඉංග්‍රීසි නීතිය හඳුන්වා දුන් ආකාරය විමසන්න. **(ලකුණු - 20)**

**03.** සෝමසුන්දරම් 1980 දී උපත ලද අතර, ඔහුගේ දෙමව්පියන් යාපනයේ දෙමළ ජාතිකයන් විය. යාපනයේ ජාතික හින්දු විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ ඔහු ද්විතීක අධ්‍යාපනය සඳහා කොළඹ තර්ස්ටන් විද්‍යාලයට ඇතුළත් විය. පාසල් අධ්‍යාපනයෙන් පසු කැළණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් වූ ඔහු උසස් අධ්‍යාපනය සම්පූර්ණ කළේය. ඉන්පසුව කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්වරයෙකු ලෙස රජයේ සිවිල් සේවයට බැඳුණේය. 2005 දී සෝමසුන්දරම් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම සේවය කළ අම්බිගා සමඟ විවාහ විය. ඇය යාපනයේ උපන් තැනැත්තියක් වූ අතර, ඇයගේ දෙමව්පියන් ද යාපනයේ දෙමළ ජාතිකයන් විය. විවාහයෙන් පසු ඔවුන් ජීවත් වූයේ මාලබේ ප්‍රදේශයේ කුලී නිවසකය. ඔවුන්ට ශර්මා නම් දරුවෙක් ලැබිණි. 2015 දී අම්බිගා එම තනතුරෙන් ඉල්ලා අස්වී ශර්මා සමඟ යාපනයට පැමිණ සෝමසුන්දරම් ගේ දෙමාපියන් සමඟ ජීවත් විය. සෝමසුන්දරම් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිගටම සේවය කළ අතර, මාලබේ පදිංචිව සිටියේය. සෑම මසකම ඔහු යාපනයට ගිය අතර අම්බිගා, ශර්මා සහ ඔහුගේ දෙමව්පියන් සමඟ දින කිහිපයක් ගත කළේය. 2020 දී සෝමසුන්දරම් කිලිනොච්චියේ නව නිවසක් ඉදි කළ අතර, යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ස්ථාන මාරුවක් ලබාගැනීමට සැළසුම් කළේය. එපමණක් නොව ඔහු කිළිනොච්චියේ තවත් ඉඩමක් මිලදී ගත්තේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට අදහස් කරමිනි. 2022 දී සෝමසුන්දරම් යාපනය බලා යමින් සිටියදී කුරුණෑගලදී සිදුවූ රිය අනතුරකින් හදිසියේ මරණයට පත්විය.

**සෝමසුන්දරම් පාලනය වන්නේ තේසවලමේ නීතියෙන්ද? නැතහොත් සාමාන්‍ය නීතියෙන් ද?** යන්න පිළිබඳව අම්බිගා ඔබගෙන් උපදෙස් පතයි.

අම්බිගා ට උපදෙස් දෙන්න. **(ලකුණු - 20)**

**04.** රන්බන්ඩා සහ බිසෝ මැණිකේ 1930 දී මහනුවරදී විවාහ වූ පාරම්පරික උඩරටියෝ වෙති. ඔවුන්ට කමල් සහ මාලනී නමින් දරුවන් දෙදෙනෙක් සිටියහ. 1950 දී, මහනුවරදී පහත රට සිංහලයෙකු වූ සුනිල් සමඟ බින්න විවාහයක් කරගත් මාලනීට අමාලි නම් එක් දරුවෙක් සිටියේය. කමල් 1954 දී පානදුරේ පදිංචි සජිනි සමඟ විවාහ වූ අතර, ඔවුන්ට සමන්ත නමින් දරුවෙකු සිටියේය.

ඉහත කරුණු මත පදනම් ව එක් එක් පාර්ශවයන්ට අදාල නීතිය විශ්ලේෂණය කරන්න. අදාල නඩු තීන්දු නීතිය සහ ව්‍යවස්ථාපිත විධි විධාන උපුටා දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

**(ලකුණු - 20)**

**05.** පහත සඳහන් විනිශ්චිත නඩු තීන්දුවල තීරණය කරන ලද මුස්ලිම් නීතියේ විවිධ පැතිකඩ අගයන්න.

(i) *රජින එදිරිව ඔබේසේකර* (1889) 9. S.C.C.11

(ii) *නීතිපති එදිරිව රීඩ්* (1964) 65 NLR 97

(iii) *අබේසුන්දර එදිරිව අබේසුන්දර* (1998) 1 Sri LR 185

(iv) *ෆායිස් මොහොමඩ් එදිරිව එල්සි පාතුම්මා* (1942) 44 NLR 574

**(5 x 4= ලකුණු 20)**

**06.** ශ්‍රී ලංකාව බහුවාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික සමාජයක් ඇති රටකි. මෙය බොහෝ විට විවිධ පුද්ගලික නීතිවල පරස්පර සම්මතයන් සමඟ සම්බන්ධ වන බහු නීති පද්ධතියක් නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකාවේ විවිධ පුද්ගලික නීති අතර ගැටුම් අවම කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ සිදු කිරීම අරමුණු කරගත් ප්‍රබල තර්කයක් ඇත.

ශ්‍රී ලංකාවේ පුද්ගලික නීතිවල එවැනි ගැටුම්කාරී සම්මතයන් ඇති ක්ෂේත්‍ර තුනක් හඳුනාගෙන එවැනි ගැටුම් අවම කිරීම සඳහා කළහැකි නීති ප්‍රතිසංස්කරණ යෝජනා කරන්න.

**(ලකුණු - 20)**

**07.** ශ්‍රී ලංකාවේ පූර්ව යටත්විජිත යුගයේ පැවති අධිකරණ විනිශ්චය සභා සහ අධිකරණ නිලධාරීන් පිළිබඳ වාර්තාවක් සැකසීම සඳහා වන කමිටුවක සාමාජිකයෙකු ලෙස ඔබ පත්කර ඇතැයි උපකල්පනය කරන්න.

අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල උදාහරණ ඇතුළත් කරමින් ඔබගේ වාර්තාව සකස් කරන්න.

**(ලකුණු - 20)**

**08.** ( **i.**) 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණ පද්ධතියෙහි අධිකරණ ධූරාවලිය හඳුනාගෙන එක් එක් අධිකරණයේ බලතල කෙටියෙන් ඇගයීමට ලක් කරන්න. **(ලකුණු - 10)**

**(ii.)** ශ්‍රී ලංකාවේ අධිකරණ මුහුණ දෙන සමකාලීන අභියෝග මොනවාද? ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ පරිපාලනය වැඩි දියුණු කළ හැක්කේ කෙසේද? සාකච්ඡා කරන්න. **(ලකුණු - 10)**

-හිමිකම් ඇවිරිණි.-